# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන)

**2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[231 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පනතේ වලංගු කාලසීමාව අවුරුදු හයේ සිට අවුරුදු නවය දක්වා දීර්ඝ කිරීම වේ.

# නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන)

එල්. ඩී.—ඕ. 41/2012.

## 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ''අවුරුදු හයක'' යන වචන වෙනුවට ''අවුරුදු නවයක'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ පැති සටහන්හි ''අවුරුදු හයක'' යන වචන වෙනුවට ''අවුරුදු නවයක'' යන වචන ආදේශ කිරීමෙන්.

2007 අංක 09 දරන පනතේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.